**සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය - 2018**

-----------------------------------------------------

**තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.1 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර

අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.3 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------------- | -------------------------------- | ------------ |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අනුකූල නොවන පරිදි රු.418,118 ක ස්ථාවර වත්කම් ක්ෂය හා රු.704,083 ක අඩමාණ ණය අධිවෙන්කිරීම, පොලී ලැබීම් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයට එකතු කර තිබුණු අතර රු.මිලියන 1.99 ක පෙර වර්ෂ ගැලපුම් වටිනාකමක් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස ගලපා තිබුණි. | පොලී ආදායම් වටිනාකම මුදල් ප්‍රවාහයට ගැලපීමේදී අතපසුවීමකින් මෙම වටිනාකම්ද ඇතුලත්ව ඇති අතර, ලාභයට ගැලපියයුතු පෙර වර්ෂ ගැලපුම් වටිනාකම සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ගලපා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය, සෑම වර්ෂයකම වාර්තා කරන කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කර අදාල වෙනස්වීම් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සලකා ක්ෂය කල හැකි කාල පරිච්ඡේදය සමාලෝචනය කළ යුතු වුවද අධිකාරියේ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනට භාවිතා කරන එකතුව රු.මිලියන 31.42 ක වත්කම් සම්බන්ධයෙන් ප්‍රමිතයට අනුකූලව කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම තක්සේරු කිරීමට ප්‍රධාන තක්සේරුකරු වෙත යොමුකර ඇත. | -එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 වර්ෂයට අදාල එකතුව රු.මිලියන 2.4 ක ස්ථාවර තැන්පතු පොලී සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණු අතර ඒ සම්බන්ධව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව කිසිදු හෙලිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. | මෙවැනි ගැලපීම් සම්බන්ධව ඉදිරි වර්ෂවල මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හෙළිරදව් කිරීම් සිදුකරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල විය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 19.93 ක ණයගැති ශේෂය තුළ වර්ෂ 05 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද ණයගැතියන් 10 දෙනෙකුගෙන් ලැබිය යුතු ශේෂය රු.මිලියන 4.02 ක් විය. එසේම යථෝක්ත ණයගැතියන් තුළ ඇතුළත් පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.807,187 ක මුදල එම සමාගමෙන් භාණ්ඩ මිලදී ගැනීම සඳහා 1999 වර්ෂයේ ගෙවූ මුදලක් වන අතර එම භාණ්ඩ ලැබීමට පෙර මුදල් ගෙවා තිබීම හා අවුරුදු 19 ක කාලයක සිට එම මුදල් අයකර ගැනීමට නොහැකිවීම අභ්‍යන්තර පාලනයේ දුර්වලතාවයක් වුවද ඒ සම්බන්ධයෙන් විධිමත් පියවරක් අධිකාරිය විසින් ගෙන නොතිබුණි. එසේම මෙතෙක් අනුකූලතා සහතික නිකුත් කර | වර්ෂ 05 කට වැඩි රු.මිලියන 4.02 ක සමතකරන ගාස්තු පොත්වලින් කපාහැරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට යොමු කර ඇති අතර ගම්පහ හා ජල්තර මුදල් අයකර ගැනීමට නොහැකි බැවින් කපා හැරීමට කටයුතු කල යුතුව ඇත. අනෙකුත් මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණු සහාධිපත්‍ය දේපළ වෙනුවෙන් ලැබිය යුතු රු.මිලියන 3.71 ක් ද වර්ෂ 04 කට පෙර සිට ණයගැතියන් ලෙස ගිණුම් ගතකර තිබුණි. | | |
| (ආ) | අධිකාරියේ විෂය පථයට ඇතුළත් නොවූ ගම්පහ හා මීගමුව රෝහල්වල පොම්පාගාර නඩත්තුව වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු මුදල රු.මිලියන 11.24 ක් වන අතර වර්ෂ 05 ට වැඩි ශේෂය රු.මිලියන 2.62 ක් විය | 2016 වර්ෂයේදී ගිවිසුම් අත්සන් කර දැනට විධිමත් ගිවිසුමක් මත මෙම කාර්යය කරනු ලබන අතර 2016 ට පසු කිසිඳු හිඟ මුදලක් නැත. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 අංක 24 දරන පොදු පහසුකම් මණ්ඩල(සංශෝධන) පනතේ 5 ඡේදයේ (ඍ) වගන්තිය | සභාධිපත්‍ය දේපළවල පොදු පහසුකම් නඩත්තු කිරීම සඳහා පළාත් පාලන ආයතන වෙත පැවරීම අධිකාරියේ අරමුණක් වුවද මාළිගාවත්ත සහ ජල්තර නිවාස ක්‍රමවල පොදු පහසුකම් පළාත් පාලන ආයතන වෙත පවරා නොතිබුණි. | මෙම ආයතන විසින් මෙම පොදු අංගෝපාංග නඩත්තුව භාරගැනීමට ඇති පසුගාමී බව හේතුකොට ගෙන මෙම පවරාදීම ප්‍රමාද වී ඇත. | යොමුගත නීතිරීති වලට අනුකූල විය යුතුය. |
| (ආ) (i) | මුදල් රෙගුලාසි මු.රෙ.371(2)(ආ) ඡේදය | කිසියම් විශේෂිත කාර්යක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් රු. 100,000 ක උපරිමයක් දක්වා අග්‍රිම ලබාදිය යුතු වුවද, ඊට අනුකූල නොවන පරිදි නිලධාරීන් 04 දෙනෙකු වෙත එකතුව රු. 840,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි. | මාණ්ඩලික නොවන තනතුරු දරණ නිලධාරීන් සඳහා අත්තිකාරම් ලබාදීම මේ වන විට සිදුකරනු නොලබයි.<br><br>වැඩසටහන් කාර්යක්ෂමව පවත්වාගෙනයාමේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අවස්ථා කිහිපයක් පමණක් මෙවැනි අත්තිකාරම් ලබාදුන් අවස්ථා ඇත. මෙම සියළු අත්තිකාරම් මුදල් මේ වන විට නිවරැදිව පියවා ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මු.රෙ.371(5)(ඈ) | අවස්ථා 18 කදී ලබාගත් එකතුව රු. 927,375 ක අග්‍රිම පියවීම සඳහා දින 20 සිට දින 48 දක්වා කාලයක් ගතවී තිබුණි. | මෙම තත්ත්වය සම්පූර්ණයෙන් විසඳීම සඳහා 2019 මාර්තු සිට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ6.5.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි | වාර්ෂික වාර්තාව විගණන වාර්තාවෙන් පසුව ලබාදෙනු ලැබේ | ගිණුම් වර්ෂය අවසන් වී දින 30 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ6.5.3 ඡේදය | අධිකාරිය විසින් 2015,2016 සහ 2017වර්ෂවල විගණන වාර්තා ඇතුළත් වාර්ෂික වාර්තා විගණිත දිනය වූ 2019 ජූනි 30 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි | 2015 හා 2016 වර්ෂවල වාර්ෂික වාර්තා අමාත්‍යාංශය වෙත යොමුකර කැබිනට් අනුමැතිය ලබා ගැනීමට නියමිත අතර 2017 වාර්ෂික වාර්තා දෙමළ පරිවර්තන කටයුතු අවසන්වූ පසු අමාත්‍යාංශය වෙත යොමුකරයි. | යොමුගත චක්‍රලේඛයට අනුගත විය යුතුය. |
| (ඉ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය | උපරිම ආපදා ණය ශේෂය වූ රු. 250,000 ක සීමාව සලකා බැලීමෙන් තොරව අධිකාරියේ නිලධාරියෙකු වෙත 2016 වර්ෂයේ ලබාදුන් ණය මුදලේ ශේෂය රු.199,250 ක් ද ඉතිරිව තිබියදී, 2018 වර්ෂයේදී නැවත රු.250,000 ක ආපදා ණය මුදලක් ලබාදී තිබුණි. ඒ අනුව 2018 | මෙම ආපදා ණය මුදලින් පසුව ගෙවීම් කර ඇති ණය මුදල සාමාන්‍ය පරිදි අයකරනු ලබන අතර කලින් ලබාදී තිබූ ආපදා ණය මුදල මාස 60කින් අයකිරීම වෙනුවට මාස 24 කින් අයකර ගැනීම සඳහා කටයුතු කරනු ලබයි. | යොමුගත චක්‍රලේඛයට අනුගත විය යුතුය. |

දෙසැම්බර් 31 දිනට එම
නිලධාරියාගේ ආපදා
ණය ශේෂය රු. 449,250
ක් විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 140.19 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 98.38ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 41.81 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම හා මෙහෙයුම් නොවන ආදායම පිලිවෙලින් රු.මිලියන 78.45 කින් හා රු.මිලියන 11.29 කින් ඉහලයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සභාධිපත්‍ය දේපළ සඳහා සහතික නිකුත් කිරීමේ ආදායම හා ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම පිළිවෙලින් රු.මිලියන 79.47 කින් හා රු.මිලියන 9.88 කින් වැඩිවී තිබුණු අතර නඩත්තු වියදම රු.මිලියන 7.14 කින් ඉහල ගොස් තිබුණු අතර කාර්යාල බදු කුලී වියදම රු.මිලියන 9.42 කින් අඩුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ ශුද්ධ වත්කම් රු.මිලියන 339.37 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ වත්කම් රු.මිලියන 201.17 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී ශුද්ධ වත්කම් රු.මිලියන 138.20 කින් හෙවත් සියයට 69 කින් වර්ධනය වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වත්කම් අනුපාතය 4:1 ක් වූ අතර පසුගිය වර්ෂයේ එම අනුපාතය 3:1 ක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ ක්ෂණික වත්කම් අනුපාතය 4:1 ක් වූ අතර පසුගිය වර්ෂයේ එය 3:1 ක් වී තිබුණි.

රු.මිලියන 259 ක් ත්‍රෛයි මාසික ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති බැවින් ජංගම වත්කම් අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය ඉහල අගයක් ගෙන ඇති බවත් අධිකාරියට වැඩි වාසි සහගත ලෙස ආයෝජනය කළමනාකරණයක් සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 40 කට වැඩි කාලයක සිට කාර්යාලය පවත්වාගෙන යන කුලී ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු වෙනුවෙන් 2018 වර්ෂයේදී අධිකාරිය විසින් රු.මිලියන 4.71 ක් වියදම්කර එහි නවීකරණ කටයුතු කර තිබුණු නමුත් එම නවීකරණ කටයුතු වෙනුවෙන් දැරූ වියදම් නිරවුල් කර ගැනීමට ගොඩනැගිලි හිමියන් සමඟ කිසිදු ගිවිසුමකට ඇතුලත් වී නොතිබුණි. | අධිකාරිය මෙම ගොඩනැගිල්ලේ පවත්වාගෙන යන අතර නඩත්තු හා අළුත්වැඩියා අධිකාරිය විසින්ම කරනු ලබයි. | කාර්යක්ෂම හා ඵලදායී ලෙස රජයේ මුදල් වියදම් කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේදී අධිකාරිය විසින් නිවාස සංවර්ධන අධිකාරිය වෙත රු. මිලියන 6.14 ක් ගෙවල් කුලී ලෙස ගෙවීම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවල් කුලී ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | කුලී ගිවිසුමට අවශ්‍ය සංශෝධන කර ගොඩනැගිල්ල හිමි ආයතනය වෙත භාරදී ඇත. | විධිමත්ව ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලිපිද්‍රව්‍ය අයදුම්පත්‍ර හා භාණ්ඩ නිකුත්කිරීමේ පත්‍රවල අංශ ප්‍රධානී අනුමැතියෙන් තොරව ගබඩාවෙන් භාණ්ඩ නිකුත්කර තිබුණු අතර, ටෝනර් හා කාට්‍රිජ භාවිතාකර ලබාගත හැකි පිටපත් සංඛ්‍යාව සලකා බැලීමෙන් තොරව සමාන වර්ගයේ ටෝනර් හා කාට්‍රිජ එකම නිලධරීන් වෙත වරින් වර නිකුත්කර තිබුණි. | ලිපි ද්‍රව්‍ය අයදුම්පත්‍ර හා භාණ්ඩ නිකුත් කිරීමේ පත්‍ර වල ගිණුම් අංශයට නිකුත් කර ඇති පිටපත් සමහරක් අත්සන් යෙදීම මඟහැරී ඇත. කෙසේ වෙතත් එම තත්ත්වය මගහරවා ගැනීම සඳහා අදාල උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත.ටෝනර් හා කාට්රිජ් භාවිතය පිළිබඳ මේ වන විට විශේෂ අවධානයක් යොමු කර ඇත. | ගබඩා පාලනය විධිමත් කළ යුතුය |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රාජ්‍ය, පෞද්ගලික හා සුනාමි සහාධිපත්‍ය දේපල වලට අදාල කළමනාකරණ සංස්ථා, කමිටු ලියාපදිංචි කිරීම හා අක්‍රීය කමිටු ලියාපදිංචිය අළුත් කිරීම, සක්‍රීය කිරීමට අදාලව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් 2018 වර්ෂයේදී රු.මිලියන 4.28 ක් වියදම් කර තිබුණු නමුත් සහාධිපත්‍ය දේපලවල පිඹුරු ලියාපදිංචිකර ඔප්පු නිකුත් කිරීම සිදුකර නොමැති බැවින් සියයට 95 ක සහාධිපත්‍ය දේපලවල කළමනාකරණ සංස්ථා හා කමිටු පිහිටුවීම සිදුකර නොතිබුණි. | සුනාමි සහාධිපත්‍ය දේපල 95% කට වැඩි ප්‍රමාණයකම සහාධිපත්‍ය පිඹුර ලියාපදිංචි සිදුකර ඔප්පු නිකුත් කිරීම සිදුකර නොමැත. ඒ අනුව කළමනාකරණ සංස්ථා පිහිටුවීමද සිදුකල නොහැක. | අනුකූලතා සහතික හා ඔප්පු ලබාදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කර කළමනාකරණ සංස්ථා පිහිටුවීම කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ හා පසුගිය වර්ෂ කිහිපයක සිට ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු 1973 අංක 10 දරන පොදු පහසුකම් මණ්ඩල පනතේසංශෝධන කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අවසන් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුල සහාධිපත්‍ය දේපල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 73 ක් පවත්වා සහාධිපත්‍ය දේපල පිළිබඳ දැනුවත් කිරීමේ ප්‍රකාශන 10,000 ක් නිකුත් කිරීමට අපේක්ෂා කර තිබුණද එම වැඩසටහන් 16 ක් පමණක් පවත්වා තිබුණු අතර කිසිදු | 2017වර්ෂයේදී අවස්ථා ගණනාවකදී රැස්වී පිළියෙල කරන ලද සංශෝධන කෙටුම්පත් සියල්ල 2018.06.30 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මේ වන විටත් එම කටයුතු කරගෙනයනු ලබන අතර අවසන්ව නොමැත. | පොදු පහසුකම් මණ්ඩල පනතේ අවශ්‍ය සංශෝධනයන් අවසන් කර ක්‍රියාකාරී සැලැස්මෙහි අපේක්ෂිත ඉලක්කයන් ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. |

ප්‍රකාශනයක් මුද්‍රණය කර නොතිබුණි.

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2006 ජනවාරි මස 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාකාරී සැලැස්ම සමග සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලස්ම හා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලස්ම සකස් කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂයේ සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම අනුව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට හා වාහන 04 ක් මිලදී ගැනීමට රු.මිලියන 110.8 ක මුදල් ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එම ප්‍රසම්පාදන කාර්යයන් සිදුකර නොතිබුණි. | ඉඩමක් මිලදී ගැනීමට රු.මිලියන 75 ක් වෙන්කර ඇත. රජයේ ඉඩමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් නාගරික සංවර්ධන අධිකාරියට දන්වා ඇත. | ප්‍රසම්පාදනක්‍රියාවලිය විධිමත් හා කාර්යක්ෂම විය යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 139 ක් හා 118 ක් විය.2018 වර්ෂයේදී නිලධාරීන් 06 දෙනකු බඳවාගෙන තිබුණු අතර පරිපාලන නිලධාරී හා පාරිභෝගික නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමේදී, බඳවා ගැනීමේ පරිපාටියට අනුකූල නොවන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීමෙන් තොරව පත්වීම් ලද අයදුම්කරුවන් දෙදෙනාට පමණක් අදාල සම්මුඛ පරීක්ෂණ පවත්වා පත්වීම් ලබාදී තිබුණි. | දැනටසමස්ථපුරප්පාඩු සංඛ්‍යාව 13 දක්වා අඩුවී ඇත.මෙම පුරප්පාඩු සඳහා ඉදිරි කාලයේදී විධිමත් බඳවා ගැනීම් කිරීමට කටයුතු කරනු ලබයි. | කාර්යමණ්ඩල පරිපාලනය විධිමත් කළ යුතුය. |

## 4. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සංශෝධිත අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 30 සිට 1187 දක්වා වෙනස්කම් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | 2018 වර්ෂයේ හැකි සෑම අවස්ථාවකම අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර ඇත. | අයවැය පාලනය විධිමත් කළ යුතුය |

**4.9** **තිරසාර සංවර්ධන අරමුණු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ‟න්‍යාය පත්‍රය” ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වුවද, 2018 වර්ෂයට අදාලව තිරසාර සංවර්ධන ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ තිරසාර සංවර්ධන උපාය මාර්ග, ඉලක්ක සහ දර්ශක සකස් කිරීමේ ක්‍රියාවලියක් දැනට ක්‍රියාත්මක කර ඇති අතර එමගින් 2030වන විට තිරසාර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට හැකිවන පරිදි 2019 වර්ෂයේ සිට තිරසාර සංවර්ධන උපාය මාර්ග ක්‍රියාත්මක කිරිමට කටයුතු කර ඇත. | තිරසාර සංවර්ධන ක්‍රියාවලිය හා එහි ප්‍රගතිය පිළිබඳ අවධානය යොමුකළ යුතුය. |
| (ආ) | තිරසර සංවර්ධන ඉලක්ක ළගාකර ගැනීමට සූදානම්වීමේදී අනෙකුත් ආයතන සමග මනා සම්බන්ධීකරණයක් නොකිරීම හේතුවෙන් ඉලක්කගත අරමුණු කරා ළගාවීමට සැලසුම් සකස් කිරීමේ හා පෙර සූදානම්වීමේ ක්‍රියාවලිය දුර්වල තත්ත්වයක පැවති බව නිරීක්ෂණය විය. | -එම - | තිරසාර සංවර්ධන ක්‍රියාවලිය හා එහි ප්‍රගතිය පිළිබඳ අවධානය යොමුකළ යුතුය. |